

# මන්නාරම මුහුදු වෙරළේ දවසක්

එල්.ඒ. සඳලි සම්මානි

# මන්නාරම මුහුදු වෙරළේ දවසක්

එල්.ඒ. සඳලි සම්මානි
කතෘ

කතෘගේ වෙනත් කෘති

සුදු පූසා (2023)
අපූරු ගෙදර බිහිසුණු රැයක් (2024)

මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර
5 ශ්‍රේණිය D

2026.05.10

ISBN 978-624-211-124-7

# පිදුම

"මන්නාරම මුහුදු වෙරළේ දවසක්"

ගවේශනාත්මක කෘතිය නිම කිරීමට

මා දිරිගන්වමින් අවශ්‍ය උපදෙස් ලබාදුන්

මාගේ ආදරණීය

ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්

සහ

නිලූෂිකා ගරුසිංහ ගුරු මෑණියන්

දෙපල වෙත

මෙම කෘතිය

ගෞරවයෙන් යුතුව පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

**මෙ**වර නිවාඩු කාලය සතුටින් ගෙවී යන බව මට වැටහුණි.

මගේ පියා රැකියාවෙහි නිරත වන්නේ මන්නාරම ප්‍රදේශයේය. අම්මයි මායි මෙවර පාසල් නිවාඩුවේ දී මාගේ පියා සමඟ මන්නාරම ප්‍රදේශයට ගියෙමු. එහේ හරිම රස්නෙයි. මං එහේ ගියාම හරිම නොයිවසිල්ලෙන් බලා ඉන්නේ මුහුදු වෙරළට යෑමටයි.

මන්නාරම මුහුදු තීරය දිගු වැලි තීරුවක් හා ශාන්ත මුහුදු රළ ඇති ප්‍රදේශයකි. අම්මාත් මාත් තාත්තාත් මුහුදු වෙරළට ගියෙමු. මුහුදු වෙරළට අඩිය තිබ්බ විටම මට හරිම සතුටක් දැණුනි. එය ඉතා සුන්දර ස්ථානයකි. වෙරළේ වැලි සුදු පාටයි. මුහුදේ රළ සමඟ සුදු පෙණ කැටි විසුරුවමින් වෙරළේ හැපෙයි. මුහුදු වෙරළේ වැලි මගේ කකුලට පෑගෙන විට හරිම සිනිදු බවක් දැණුනි.



''පුතේ එන්න අපි වැලි මාලිගාවක් හදමු''. අම්මා කීවාය.

''හා අම්මේ'' යැයි මම කීවෙමි.

අපි ලස්සන වැලි මාලිගාවක් හැදුවෙමු. ඒත් එකපාරටම ආපු ලොකු රැල්ලකට ඒක කැඩුනා. ඒ නිසා අපට හරිම දුකයි.

''කොහොමද අම්මේ මුහුදෙන් රැල්ල එන්නේ''. මම ඇසුවෙමි.

''පුතේ දවල්ට ඉර එළියෙන් ගොඩබිම රත් වෙනවා. එතකොට ගොඩබිම තියෙන වායුව රත් වෙනවා. වායුව රත් වෙනකොට වායුව ඉහළ නගිනවා. ඒ අඩුවෙන වායුව පුරවන්න මුහුදේ ජලය මත තියෙන වායුව ගමන් කරනවා. එතකොට සුළඟක් ඇතිවෙනවා. ඒ සුළඟ මඟින් මුහුදු ජලය ගොඩබිම දෙසට එනවා. ඒකට තමා අපි රැල්ල කියන්නේ ''. අම්මා කීවාය.

මුහුද අයිනේ ලස්සන කඳුගැටයක් තිබුණා.

''එන්න පුතේ අපි මේ කන්දට නැගලා වටපිටාව බලමු''.

තාත්තා කීවා.

''හා තාත්තේ, ඉන්න මම එනවා''.  මම කීවෙමි.

මමත්, අම්මාත්, තාත්තාත් කන්ද මුදුනට නැග්ගෙමු.



''මොනවද තාත්තේ මේ ගස් ?'' මම ඇසුවෙමි.

''පුතේ මේ ගස්වලට තමා කියන්නේ දඹ කියලා. මේ ගසේ චූටි චූටි දම් පාට ගෙඩි තියෙනවා. එන්න පුතේ අපි මේවා කමු. මේවා හරිම රසවත් වගේම ගුණයි''. තාත්තා කීවේය.



අපි ඒවා ආසාවෙන් කෑවෙමු.

''අනේ තාත්තේ මේවා හරිම රසයිනේ. මට තව ගෙඩියක් දෙන්නකෝ. තාත්තේ ඇයි මේ ගස් අපි මගදි දැක්ක දඹ ගස්වලට වඩා උසින් අඩු ?'' මම ඇසුවෙමි.

''මේ හරියේ මුහුදු සුළඟ වැඩියි. උසට ගස් හැදුනොත් සුළඟට ඒවා කැඩෙනවා. ඒ සුළඟට ඔරොත්තු දෙන්න සොබා දහමෙන් ඒ ගස්වල උස අඩු වෙලා තියෙනවා''. තාත්තා කීවේය.

''තාත්තේ,  අර ගස් මොනවද ?''   මම ඇසුවෙමි.

''පුතේ අර දිග කොළ තියෙන්නේ වැටකෙයියා ගස්වල. අර පහළ වෙරළේ පැත්තක තියෙන්නේ කඩොලාන. බලන්න ඒවා වෙරළ රැකගෙන තියෙන විදිහ. ඒවා නිසා මුහුදෙන් එන රැල්ල වේගෙන් ඇවිත් වෙරළේ වැදෙන එක නවත්වන නිසා වෙරළ ඛාදනය වලක්වනවා. ඒ වගේම මුහුදේ ඉන්න මසුන්ට හා පියාඹා යන කුරුල්ලන්ට වාසස්ථානත් සපයා දෙනවා''. තාත්තා කීවේය.



''අනේ අම්මේ, අපි මුහුදේ නාමුකෝ...''  මම කීවෙමි.

''හා  පුතේ''  ඇය කීවාය.

අපි සුදෝ සුදු වැලි තියෙන වෙරළ දිගේ දුවගෙන දුවගෙන ගියෙමු. කකුල්වලට හරිම සනීපයි.

''තාත්තේ මේ මොකෙක්ද? රැල්ලට ගහගෙන ආවේ. එයා නිල්ම නිල් පාටයි. එයාගේ සෙවල වගේත් තියෙනවා''.  මම ඇසුවෙමි.

''හා.. හා... හා.... එයා අල්ලන්න එපා. එයාව ඇගේ ගෑවුනොත් කසනවා. ඒ ජෙලි ෆිෂ් කෙනෙක්''. තාත්තා කීවේය.



''අම්මේ මේ මොකෙක්ද? මේ වැලි උඩ අනේ... ලස්සන බෝල''. මම ඇසුවෙමි.

''පුතේ කකුළුවා වැල්ල මතුපිට ඉඳලා වැල්ල ඇතුළට රිංගන කොට එයා උමගක් හාරනවා. ඒ හාරන කොට ඉවත් කරන වැලි බෝල බෝල වගේ එළියට එනවා. ඒවා තමා අපිට පබළු වගේ දකින්න ලැබෙන්නේ''. අම්මා කීවාය.



''පුතේ මේ මුහුදු වෙරළ ගොඩක් සතුන්ට වාසස්ථානයක්. නොයෙකුත් මාළු වර්ග, කකුළුවෝ, මුහුදු කුරුල්ලෝ, පිටරට වලින් එන සංචාරක පක්ෂීන් වගේම සමහර කාලවලට ඩොල්ෆින්ලත් එනවා.'' තාත්තා කීවා.



''අනේ තාත්තේ ඩොල්ෆින්ලා එන කාලෙට මා එක්ක එන්නකෝ.'' මම කීවෙමි.

''හා පුතේ'' තාත්තා කීවේය.



''පුතේ මේ මන්නාරම් මුහුදු වෙරළ මිනිසුන්ට හරිම වැදගත්'' තාත්තා කීවේය.

''ඇයි ඒ තාත්තේ'' මම ඇසුවෙමි.

''මේ මුහුදු වෙරළෙ තියෙන ලස්සන නිසා සංචාරකයෝ මෙහේ එන්න හරිම කැමතියි. ඒ වගේම මේ මුහුදු වෙරළ ආසන්නයේ තියෙන ධීවර ගම්මානවල මිනිසුන් ජීවත් වෙන්නේ මුහුදේ මසුන් අල්ලමින්. අන්න ඒ නිසයි මිනිසුන්ට මේ වෙරළ තීරය වැදගත් වෙන්නේ.'' තාත්තා කීවේය.



''අනේ තාත්තේ මේ බලන්න මිනිස්සු පොලිතින්, ප්ලාස්ටික් දාලා විනාශ කරලා තියෙන විදිය. මේ හරිය හරිම ගඳයි''. මම කිවේමි.

''ඔව් පුතේ කසල මුහුදට දැමීම, පොලිතින් මුහුදට දැමීම වැනි දේ නිසා මුහුදු සතුන්ට හානි වෙනවා. කසල වෙරළේ ගොඩගැසුනු විට වෙරළ අපවිත්‍ර වෙනවා''. තාත්තා කීවා.

''තාත්තේ අපි මුහුදු වෙරළට කැළි කසල දාන්නේ නැතිව තිබුණොත් අපිටත් පුළුවන් නේද වෙරළ ලස්සනට තියාගන්න''. මම කීවෙමි.

''දැන් රෑ වුනා නේද පුතේ? අපි දැන් අපි ඉන්න නවාතැන්පලට යමු''. තාත්තා කීවේය.

''හා අපි යමු''. මාත්, අම්මාත් කීවෙමු.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-124-7